## විජේවීර මැරුවට ගුණදාස අමරසේකර එදා රංජන් විජේරත්නට ස්තුති කළා !!

කොමියුනිස්ට් පක්ෂයක් ලෙසට හඳුන්වා ගන්නා ජනතා විමුක්ති පෙරමුණ ලංකාව තුළ බෙදා හරින්නේ කොමියුනිස්ට්වාදය හැර අනෙකුත් දේවල්. දැන් ආණ්ඩුව ආරක්ෂා කිරීමේ ලොකුම කොන්ත්‍රාත්කරු වෙලා ඉන්නේ එම පක්ෂයයි. මෛත්‍රිපාල සිරිසේන ඇමතිතුමා හොඳට බය කෙරුවා විමල් වීරවංශලාව, ආණ්ඩුව වැටුණොත් ඒ නායකයින්ට වෙන දේ කියලා. රනිල් ආවොත් එතුමන්ලටවත් විමල්ලව බේරගන්න බැරි වෙයිලු. මට හිතෙන හැටියට විමල්ලගෙත් ඔළුවේ ලොකුවටම වැඩ කරන්නේ මේ කාරණාව තමයි. ආණ්ඩුව ගොඩනැගීම වෙනුවෙන් කරපු දේවල් වගේම එදා ඔවුන් ගෙන ගිය ත්‍රස්තවාදය ගැන යූඇන්පියෙන් ලැබුණ ප්‍රතිචාරය ගැනත් විමල්ලාට අමතක කරන්න බෑ. එදා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයෙන් ලංකාව පුරා හැම පක්ෂයකම අය මරා දැමුවා. ඒත් ඒ ඔක්කොම හත් දහසකට වඩා වැඩි නැති බවයි ආණ්ඩුවේ එදා වාර්ථාවල තිබුණේ. ඒත් එයට විරුද්ධව ඔපරේෂන් කොම්බයින් (Operation Combine) යටතේ පනස් දහසකට වැඩි පිරිසක් මරා දමපු බවයි වාර්තා වෙන්නේ. එදා එම Operation Combine දියත් කළ වට මේස සාකච්ඡාවට නව සම සමාජ පක්ෂය හැර අනෙක් ඔක්කොම පක්ෂ සහභාගී වුණා. ඒ විතරක් නෙවෙයි, එදා දියත් වුණ මර්ධනයට සමහර ඊනියා දේශවිමුක්ති උදවියත් උදව් වුණා. එයින් ප්‍රධානියෙක් තමා දොස්තර ගුණදාස අමරසේකර මහත්තයා. උන්නැහේ ඉන්දීය හමුදාවල් දිහා බැලුවෙත් විජේවීර උන්නැහේ බැලුවට වඩා වෙනස් ලෙසකටයි. විජේවීර කිව්වේ, ඉංදීය වඳුරු හමුදාව ලංකාවට කඩා වැදී ඇත්තේ මෙරට තුළ පෙඩරල් ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් කියලයි. ඒ අනුව වර්ධරාජා පෙරුමාල් මගින් පෙඩරල් ක්‍රමයකට ඒ අය රට ඇදගන්න හදන බවත් එදා කියැවුණා. කොටි සංවිධානයට අනියම් ලෙස සහන දීමක් ලෙසටයි මෙය පෙනුනේ. දොස්තර ගුණදාස අමරසේකර වැනි අය විශ්වාස කළේ ඉංදීය හමුදාව මගින් කොටි සංවිධානය මැඩ පැවැත්වීමට කටුයුතු කිරීම නිවැරදියි කියලයි. මෙයට විරුද්ධ වුණ විජේවීර එක්තරා පිස්සෙක් ලෙසටත් ඔහු දැකලා තියෙනව. එනිසාම විජේවීර අත්අඩංගුවේදීම මරා දැමීම ගැන එදා හිටපු ආරක්ෂක ඇමැති රංජන් විජේරත්න මහතාට ස්තුති කරන්නටත් දොස්තර ගුණදාස අමරසේකර කටයුතු කළා. මේ අනුව බැලුවහම විමල්ලට විරුද්ධව රනිල් වික්‍රමසිංහලා විතරක් නෙවෙයි ඉඳලා තියෙන්නේ, සමහර අද ඉන්න මිතුරොත් ඉඳලා තියෙනවා.

මේ අනුව ආණ්ඩුව පෙරළීමට වඩා තවමත් ජනතා විමුක්ති පෙරමුණ හදන්නේ එය තමන්ගේ මතය දෙසට නැඹුරු කරගන්නටයි. නැත්නම් යම් කුමන්ත්‍රණ පියවරකින් හෝ ආණ්ඩුව වඩා ජාතිවාදී, යුධවාදී විකල්පයක් ලෙස වර්ධනය කරගැනීමට ඔවුන් උත්සාහ දරනවා. මේ බව දන්න මහින්ද රජයේ බලවතුන් රනිල් බිල්ලා පෙන්වමින් ජනතා විමුක්ති පෙරමුණ මෙල්ල කරගෙන ආණ්ඩුවේ මුක්කුවක් ලෙස පවත්වාගෙන යන්නට ක්‍රියා කරනව. අනෙ අතට මේ තත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණ ඉවත් කරගෙන පාර්ලිමේන්තුව තුළ හෝ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන තැනකට පත් කරගන්නට රනිල් විවිධ උපමාරු දමනව. බදු පනත්වලට ඡන්දය විමසීමේදී මතු වුණ ප්‍රශ්නත් ඒ අනුව ඇති වුණ එකක්. ජනතා විමුක්ති පෙරමුණ එකඟ කරගත්තත් විපක්ෂයට වැඩි ඡන්දයක් එදාත් ලබා ගන්නට බැරි වුණා. ඒ ඇත්ත, පාර්ලිමේන්තුව තුළ ස්ථාවර නියෝග ගැන කථාවෙන් වහන්න බෑ. ඇත්තටම ආණ්ඩුව පරාජයට පත් කරලා අගමැති වෙන්නට හෝ මැතිවරණයකට යන්නට රනිල්ට ඕනෑද? මේ ජනාධිපති යටතේ

අගමැති වෙලා අලුත් දෙයක් කරන්නට හැකි වෙයිද? මේ අනුව සමහර විට රනිල් බලන්නේ කවල් දමමින් ජනාධිපතිවරණය වෙනකල් කල්බලන්න වෙන්න පුළුවන්. ඒ අනුව රනිල්ටත් මහින්ද පෙරළන්න ලොකු තදියමක් නෑ. විජේවීර උන්නැහේ අමුඅමුවේ මරා දැමීම ගැන ස්තුති පුද කළ අය සමඟ අත්වැල් බැඳගෙන ජනතා විමුක්ති පෙරමුණට ජාතික පෙරමුණක් ගොඩනගන්නත් බෑ. මේ අනුව මේ විරුද්ධ පක්ෂ දෙකම එකතැන පල්වෙන ලකුණු මතුවෙලා.

රනිල් ගෝලීය ධනවාදය ගැන කල්පනා කරන, ඒ මගින් ඇති කරගත හැකි සංවර්ධනය ගැන විශ්වාස කරන නායකයෙක්. ඒ අනුව මහින්දගේ සංවර්ධන වැඩ ගැන ඒ තරම් විවේචනයක් උන්නැහේට නෑ. දූෂණ ගැන පමණයි විවේචනය. ඒත් ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ ගෝලීය ධනවාදයට යට නොවී දේශීය ව්‍යාපාරවලට තැන දෙන ජාතික ආර්ථිකයක් ගෙඩනැගිය යුතු බවයි. කියුබාව, වෙනිසියුලාව වැනි රටවල්වල ගමන ගැනයි නිතර කථා කරන්නේ. එහෙම නම් ජාතික ආර්ථිකයකට ජාතික සමඟිය අවශ්‍යයි. විශේෂයෙන්ම උතුරු-නැගෙනහිර ගොවි ධීවර ජන සහය අවශ්‍ය වෙනව. කොටි සංවිධානය තුළත් සැහෙන පිරිසක් දේශීය සම්පත් ගැනයි බලාපොරොත්තු තියලා තිබෙන්නේ. සිංගප්පූරු සිහිනය තියෙන්නේ ශ්‍රීන් කාඩිකාර කොටි නායකයින්ට විතරයි. එනිසා පහළ දෙමළ සටන්කාරයින් එකතු කරගන්නේ නැතිව ජාතික ආර්ථිකයක් ගොඩනගන්න බෑ. අනෙක් අතට ගුණදාස අමරසේකර වැනි අය මූලිකව බලන්නේ දෙමළ බලය මැඩීම ගැන විතරයි. ඒ සඳහා විදේශ හමුදා ගෙන්වීමටත් ඔවුන් ලෑස්තියි. ඒ හින්දා තමයි ඔවුන් විජේවීර සමඟත් වෛර බැඳගත්තේ. ඉන්දීය වඳුරු හමුදා ගෙන්වා ගැනීම ගැන විජේවීර තදින් විරුද්ධ වුණා. මේ නිසයි ඔහු අමරසේකර වැනි අයගේ වෛරයට පාත්‍ර වුණේ. එතකොට එවැනි අයත් සමඟ එක්වෙලා විමල්ලා ගොඩනගන ජාතික ආර්ථිකය මොකක්ද? රටේ සම්පත් හා නිදහස බිළි දීලා හෝ දෙමළ, මුස්ලිම් ජනයා මර්ධනය කිරීමට හිතන, ඒ වෙනුවෙන් විදේශ හමුදා වුණත් ගෙන්වීමට ලෑස්ති කොටස් සමඟ ඇති දේශ හිතෛශී පෙරමුණ මොකක්ද?